# කළමනාකරණ කමිටු රැස්වීම

දිනය - 2023.09.27

වේලාව - පෙ.ව. 10.15

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප)

මූලාසනය - ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)

සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය

1. එල්.ඒ.කළුකපුආරච්චි මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
2. ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
3. ඒ.එම්.එස්.මල්කාන්ති මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
4. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
5. පී.පී.විජේවීර මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක
6. කේ.එන්.කේ.සිල්වා මිය - ආදායම් කොමසාරිස් (බ.ප)
7. ටී.කේ.ආර්.දිලේශිකා මිය - ප්‍රධාන ගණකාධිකාරී (ඉංජිනේරු)
8. පාලිත අබේවර්ධන මයා - ප්‍රධාන නීති නිලධාරී, නීති ඒකකය
9. එම්.ඩබ්ලිව්.එස්.කුරේ මයා - අධ්‍යක්ෂ (අය වැය)
10. කේ.ජී.සුදර්ම සිසිර කුමාර මයා - අධ්‍යක්ෂ (සැලසුම්)
11. ඕ.සී.නිලූෂිනී මිය - අධ්‍යක්ෂ ( ආදායම්)
12. එන්.එච්.සුමින්ද මයා - අධ්‍යක්ෂ (ගිණුම් හා ගෙවීම්)
13. ආශා පනාගොඩ මිය - අධ්‍යක්ෂ(ඉංජිනේරු)
14. ඒ.තලංගම මයා - මූලස්ථාන ඉංජිනේරු
15. කේ.එන්.සූරියආරච්චි මිය - සහකාර ප්‍රධාන ලේකම් (පාලන)

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති කළමනාකරණ කමිටු රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | නව පත්වීම් ලබා දුන් බහුකාර්ය සංවර්ධන සහයකයින් සම්බන්ධව | නව පත්වීම් ලබා දුන් බහුකාර්ය සංවර්ධන සහකරුවන් හා දැනට පවතින පුරප්පාඩු හා පළාත් පාලන ආයතන සඳහා බහුකාර්ය සංවර්ධන සහකරුවන් ලබා දීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී.<br><br>තවද පුහුණුව සඳහා බඳවා ගැනීමේදී අවුරුදු 45 ක් වූ බහුකාර්ය සංවර්ධන සහකයින් සඳහා පත්වීම් ලබා දීම සම්බන්ධව හා PL1 ලෙස බඳවා ගෙන ඇති බහුකාර්ය සංවර්ධන සහකයින් සේවා අවශ්‍යතාවය අනුව PL2 හා PL3 තනතුරු වලට පත්වීම් සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුම් දී ඇති බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 02. | අමාත්‍යාංශ වල පුරප්පාඩු පිරවීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා අනිකුත් ආයතනවල පවතින පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය මඟින් ලබා දී ඇති ලේඛනයට අනුව ලබා දී ඇති තනතුරු සම්බන්ධ තොරතුරු සාකච්ඡා කරන ලදී.<br><br>එහි සඳහන් ඇතැම් තනතුරු වලට සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන් පළාත් සභා රාජ්‍ය සේවය තුල සේවය කරන බැවින් එම තනතුරු පළාත් රාජ්‍ය සේවයෙන්ම පිරවීම සුදුසු බව සාකච්ඡා කළ අතර එම තනතුරු ලේඛනය කැබිනට් මණ්ඩලයට යොමු කිරීමේදී ඒකාබද්ධ රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් අතුරෙන් අදාළ බඳවා ගැනීම් පටිපාටියට අනුව විධිමත් පරිදි නිලධාරීන් බඳවා ගැනීම ලෙස සංශෝධනය කිරීම සිදු කරන අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත දැනුම් දීම සුදුසු බව තීරණය කරන ලදී.<br><br>බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇති තනතුරු ලයිස්තුවට අනුව බඳවා ගැනීම් සම්බන්ධව කාල රාමුවක් සකස් කරගත යුතු බවත් ඒ සම්බන්ධව සියළු අමාත්‍යංශ ලේකම්වරුන් සමඟ සාකච්ඡා කිරීමට සැලසුම් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 03. | කාර්ය සාධන තරඟාවලිය සම්බන්ධව | මේ වන විට අදාළ විනිශ්වය මණ්ඩල පත්කර කාර්යාල පරික්ෂා කිරීමේ කටයුතු ආරම්භ කර ඇත . මෙම පරික්ෂා කිරීම් ඔක්තෝම්බර් මස අවසානය වන විට නිම කිරීමට බලාපොරොත්තු වන බවත් , ඇතැම් කාර්යාල අධික්ෂණය කිරීමේදී එක් දිනයක් ප්‍රමාණවත් නොවී ඇති අතර එවැනි අවස්ථාවල අමතර කාලයක් ලබා දීමට සිදුවන බවත් , සියලුම විනිශ්වය කටයුතු අවසන්කොට දෙසැම්බර් මස තුන්වන සතියේදී අවසාන ඇඟයීම් උත්සවය පැවැත්වීමට කටයුතු සූදානම් කරන බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br><br>එමෙන්ම මෙම තරඟ ජයග්‍රාහිකයින් සඳහා රන්, රිදී, ලෝකඩ සම්මාන මෙන්ම සහතික පත්‍ර හා කුසලතා සහතික පත්‍ර ප්‍රදානය කිරිමට බලාපොරොත්තු වන බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී.<br><br>මෙම කාර්ය සාධන තරඟාවලිය සඳහා ඉදිරිපත් වූ අඩු කාර්ය සාධනයක් සහිත අමාත්‍යාංශ . දෙපාර්තමේන්තු හා ආයතන වල ප්‍රධානීන් වෙත අඩු කාර්ය සාධනයක් පවතින බැවින් නැවත පැවැත්වෙන ඊළඟ කාර්ය සාධන තරඟාවලියේදී කාර්ය සාධන මට්ටම වැඩි කර ගැනීම සම්බන්ධව දැනුවත් කර ලිපියක් යොමු කිරීමට කටයුතු කර දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>ජයග්‍රාහී කාර්යාල සඳහා ලබා දෙන සහතික පත්‍ර මුද්‍රණය කිරීමේ කටයුතු වෙස්ප්‍රෝ ආයතන වෙත පැවරීමටත් ,<br>කර්මාන්ත දෙපාර්තමේන්තුව වෙතින් කුසලාන සකස් කිරීමට ඇති හැකියාව සම්බන්ධව සොයා බලන ලෙසත් සුදුසු බවටත් තීරණය කරන ලදී.ඒ අනුව කුසලාන සකස් කිරිමේදී රන් රිදී ලෝකඩ ලෙස හඳුනා ගැනීමට පහසුවන ලෙස කුසලාන සකස්විය යුතු බව ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 04. | හොඳම වාර්ෂික වාර්තා තරඟාවලිය සඳහා ඉදිරිපත් වීම සමබන්ධව | හොඳම වාර්ෂික වාර්තා තරඟාවලිය සඳහා අදාළ වාර්තාව සකස්කර මේවන විට ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා නිසි ඇගයීමක් ලැබෙනු ඇතැයි තමා අපේක්ෂා කරන බවත් ඒ සඳහා කටයුතු කළ සියළු නිලධාරීන්ට තමාගේ ප්‍රසංසාව හිමිවන බවත් ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ වෙනුවෙන් සෘජු දායත්වයකය ලබා දුන් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) ප්‍රමුඛ අදාළ කාර්ය මණ්ඩලයට ප්‍රසංසා සහතිකයක් නිකුත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 05 | ආපන ශාලාවේ නිකරුනේ කාලය ගත කිරිම සම්බන්ධව | ආපන ශාලාවේ නිකරුනේ කාලය ගත නොකරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලෙස ආයතන ප්‍රධානීන් වෙත දන්වා ඇති නමුත් තව දුරටත් එසේ ආපන ශාලාව තුල රැඳී සිටින නිලධාරීන් සිටින බැවින් සෑම මේසයකම ආහාර ගැනීම සඳහා පමණක් බවත් නිකරුනේ කාලය ගත කිරීම තහනම් බව සඳහන් දැන්වීමක් පළ කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 06. | බස්නාහිර පළාත් සභාවට අයත් කාර්යාල පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණය තුල ස්ථාපිත කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් කුලී පදනම මත පවත්වාගෙන යන ආයතන අතරින් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව , ඉඩම් කොමසාරිස් කාර්යාලය හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය (කොළඹ) යන ආයතන බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතින බවට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු) විසින් කරුණු පැහැදිලි කරන ලදී.<br>ඒ අනුව 2024 ජනවාරි පළවෙනි දින වන විට එම ආයතන බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ල තුල ස්ථාපිත කිරීමට එම ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් ඒ සම්බන්ධව ඉදිරිපත් කරන කිසිදු අභියාචනයක් පිළි නොගන්නා ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>තවද ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත පැමිණීමේදී ආදායම් දෙපාර්තමේන්තුවේ පිවිසුම් මාර්ගය භාවිතා කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් වී ඇති බවට සාකච්ඡා වූ අතර එය සුදුසු බවටත් එහිදී පරිශ්‍රයට ඇතුළුවන පුද්ගලයන්ගේ අනන්‍යතාව පරීක්ෂා කිරීමේ කටයුතු ආරක්ෂක අංශ සිදු කල යුතු බව දැනුම් දෙන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 07. | බස්නාහිර පළාත් වෙබ් අඩවි තරඟාවලිය සම්බන්ධව | 2024 වර්ෂයට මෙන්ම 2023 වර්ෂය සඳහාද බස්නාහිර පළාත් ආයතනවල වෙබ් අඩවි තරඟාවලිය පැවැත්වීමට කටයුතු කරන බවත් ඒ අනුව ඉදිරි සතිවල ඒ සඳහා කටයුතු ආරම්භ කරන අතරම කාර්ය සාධන තරඟාවලිය සඳහා ආයතන ඇගයීම සිදු කරන දිනයේදීම මෙම තරඟාවලියට අදාළ කුසලාන හා සහතික පත් ප්‍රදානය සඳහා කටයුතු සූදානම් කරන බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු සඳහන් කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 08. | ප්‍රධාන ශ්‍රවනාගාරය සඳහා විදුලි බුබුළු සවි කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් ප්‍රධාන ශ්‍රවනාගාරයේ විදුලි බුබුළු කිහිපයක්ම පිළිස්සී ඇති අතර ඒ සඳහා කඩිනමින් විදුලි බුබුළු සවි කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් මූලස්ථාන (ඉංජිනේරු) වෙත උපදෙස් ලබා දෙන ලදී. | මූලස්ථාන ඉංජිනේරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 09. | අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සම්බන්ධව | අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සම්බන්ධව තව දුරටත් සෑහීමට පත්විය නොහැකි බවත් අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් සූදානම් කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමා දන්වා ඇති බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.<br><br>එමෙන්ම විගණන කටයුතු සිදු කිරීමේදී විගණනයට බඳුන්වන නිලධාරීන් ගේ අඩුපාඩු පමණක් නොදකින ලෙසත් , සෑම විටම සුභවාදී හැඟීමෙන් කටයුතු සිදු කරන ලෙසට විගණන නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලෙස ප්‍රධාන ලේකම් විසින් වැඩි දුරටත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දෙන ලදී. | අධ්‍යක්ෂ , අභ්‍යන්තර විගණන |
| 10. | ප්‍රතිපාදන හා වියදම් පිළිබඳ වාර්තාව සම්බන්ධව | 2024 වසර සඳහා ලැබී ඇති ප්‍රතිපාදන සම්බන්ධව සාකච්ඡා කරන ලදී. ඒ අනුව උපමාන පාදක වැඩසටහන් සඳහා රුපියල් මිලියන 58 ක් අනුමත කර ඇති අතර රුපියල් මිලියන 66.9 ක මුදලක් ලැබී ඇත.පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙනුවෙන් ඉල්ලීම් කරන ලද රුපියල් මිලියන 1261ක මුදලින් රුපියල් මිලියන 378 ක්ද, අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘති රුපියල් මිලියන 800ක් ලැබී ඇති බවත් , අළුත් වැඩියා කටයුතු සඳහා ඉල්ලුම් කරන ලද රුපියල් මිලියන 2588 ක ප්‍රතිපාදන වලින් රුපියල් මිලියන 863 ක මුදලක් ලැබී ඇති බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) විසින් සඳහන් කරන ලදී.<br><br>එමෙන්ම උපමාන පාදක වැඩසටහන මඟින් රුපියල් මිලියන 22 ක් සඳහා ප්‍රධාන ලේකම් විසින් ආණ්ඩුකාරතුමා සමඟ නව යෝජනා (තලංගම රෝහලේ නව ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා රුපියල් මිලියන 10ක් ) සම්බන්ධව සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 11. | බස්නාහිර පළාත් පාසැල්වල උසස් පෙළ ගුරු පත්වීම් ලබා දීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභා පාසැල් සඳහා පවතින ගුරු පුරප්පාඩු පිරවීමට අදාළ මූලික කටයුතු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් සිදු කරමින් පවතින අතර එම පත්වීම් ප්‍රධානෝත්සවය 2023.12.01 වන දින අරලියගහ මන්දිරයේදී සිදු කිරීමට අපේක්ෂිතය. ඒ අනුව එය අරලියගහ මන්දිරයේදී පැවැත්වීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කර දෙන ලෙස අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු ) වෙත උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 12. | පාර්ලිමේන්තු ප්‍රශ්නාවලියේ කටයුතු සම්බන්ධව | පාර්ලිමේන්තු ප්‍රශ්නාවලියේ ප්‍රධාන ලේකම් කාර්යාලයට හා අරමුදල් ගිණුම සඳහා සෑම අංශයකින්ම සකස්විය යුතු කොටසක් ඇති බවත් එක් එක් අංශවලින් සකස්විය යුතු කොටස් වෙන්කර ඇති අතර අඩුපාඩු සකස්කර ගත යුතු බවත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් කරුණු දක්වන ලදී.<br><br>ඒ අනුව සෑම අංශයකින්ම අංශ ප්‍රධානියා වගකීම සඳහා මාණ්ඩලික නිලධාරියෙක් පත්කර ගන්නා ලෙස ප්‍රධාන ලේකම් විසින් ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) වෙත උපදෙස් ලබා දෙන ලදී. | සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 13. | පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් වාහන බලපත්‍ර ලබා දීමේ ප්‍රමාදවීම් සම්බන්ධව | වෛද්‍යවරුන් සඳහා වාහන ලබා ගැනීමේ අවසර පත්‍ර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබා දීමේදී ප්‍රමාදයන් සිදුවන අතර ඇතැම් අවස්ථාවල වසරක පමණ කාලයක් ප්‍රමාදවන බවට අධ්‍යක්ෂ ගිණුම් හා ගෙවීම් විසින් කරුණු දක්වන ලදී.ඉල්ලුම් පත්‍ර ලැබී දින දෙකක් ඇතුලත මූල්‍ය අංශය මඟින් බලපත්‍ර නිකුත් කරන නමුත් ඉල්ලුම් පත් ලබා දුන් දිනට අනුව වාහන බලපත්‍ර නිකුත්කළ දිනය සඳහන් කිරීමේදී නිරීක්ෂණය වන්නේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් සිදුවූ ප්‍රමාදයක් ලෙස බවට වැඩි දුරටත් කරුණු දක්වන ලදී.<br><br>මේ සම්බන්ධව සඳහන් කර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ප්‍රධාන ලේකම්ගේ අත්සනින් යුතුව ලිපියක් යොමු කිරීමට කටයුතු කරන ලෙසත්, එහි "ඔබ අතින් සිදුවන ප්‍රමාදයන් සම්බන්ධ වගකීම මින් ඉදිරියේදී ප්‍රධාන ලේකම් විසින් භාර නොගන්නා බවත් , වාහන බලපත්‍ර ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත් භාර දුන් නිලධාරීන්ද ඒ සම්බන්ධව දැනුවත් කරන බවත්" එහි සඳහන් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>තවද වාහන බලපත්‍ර ලබා දීමේදී ඊට අදාළ ඉල්ලුම් පත්‍ර සියල්ල ද නැවත එම නිලධාරීන් වෙතම ලබා දීමට කටයුතු කරන බවද අධ්‍යක්ෂ ගිණුම් හා ගෙවීම් විසින් වැඩි දුරටත් සඳහන් කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 14. | වැටුප් සහිත නිවාඩු සම්බන්ධව | ඇතැම් අමාත්‍යාංශවල වැටුප් රහිත නිවාඩු අයකර ගැනීමට කටයුතු නොකර අධික කාලයක් එකතු වූ වැටුප් රහිත නිවාඩු අයකර ගැනීම සඳහා අධිකරණ ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් කරන බවට ප්‍රධාන නීති නිලධාරී විසින් කරුණු ඉදිරිපත් කරන ලදී .<br><br>ඒ අනුව මෙය වැටුප් ගෙවීමේදී අයකර ගැනීමට කටයුතු නොකිරීම පරිපාලනමය ගැටළුවක් වන බවත් , අධ්‍යාපන අමාත්‍යාංශය මෙවැනි ගැටළු වැඩි වශයෙන් ඉදිරිපත්වන අමාත්‍යාංශයක් බවත් සඳහන් කරන ලදී.<br><br>මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්වරුන් දැනුවත් කිරීමට තීරණය කරන ලදී. | ප්‍රධාන නීති නිලධාරී |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 15. | අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලික විමර්ශන සඳහා සංචිතයක් නම් කිරිම සම්බන්ධව | බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැඩි වශයෙන් මූලික විමර්ශන සිදු කිරීමට සිදු වන බැවින් එම අමාත්‍යාංශයෙන් මූලික විමර්ශන සිදු කිරීම සඳහා නිලධාරී සංචිතයක් නම්කර එවන ලෙස අමාත්‍යාංශ ලේකම් වෙත දැන්වීමට තීරණය කරන ලදී.<br><br>ඒ අනුව එම සංචිතය සඳහා මූලික විමර්ශන පැවැත්වීම සම්බන්ධ පුහුණුවක් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 16. | මානව සම්පත් පුහුණු මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය පිළිසකර කිරිම සම්බන්ධව | මොරන්ත මානව සම්පත් පුහුණු මධ්‍යස්ථානයේ මේ වන විටත් අත්‍යාවශ්‍ය පුහුණු කටයුතු සිදු කරමින් පවතින අතර එහි නේවාසිකාගාරයේ පිවිසුම් මාර්ගය අධික වර්ෂාවත් සමඟ පිච්චීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති අතර ඒ සඳහා ගල් ස්වීකර පිළිසකර කර දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත්කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br><br>එය පිළිසකර කිරීමේ කටයුතු සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු/ ඉංජිනේරු) |
| 17. | බස්නාහිර පළාත් නිල නිවාස හා රජයේ නිවාස සම්බන්ධ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් නිල නිවාස හා රජයේ නිවාස සම්බන්ධව මේවන විට තොරතුරු තාක්ෂණය යොදාගෙන තොරතුරු රැස් කරමින් පවතින අතර අමාත්‍යාංශ මට්ටමින් එම තොරතුරු ඇතුලත්කර දත්ත ගබඩාවක් බවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන) විසින් කරුණු දක්වන ලදී.<br><br>නිල නිවාස , රජයේ නිල නිවාස මෙන්ම බස්නාහිර පළාත් සභාව සතු ඉඩම් සම්බන්ධ දත්ත නිවැරදිව ගබඩාකර නොතිබීම මත වත්කම් කළමනාකරණයේදී ද ඉදිරියේදී ගැටළු මතුවිය හැකි බැවට වැඩි දුරටත් කරුණු පැහැදිලි කරන ලදී.<br><br>ඉහත කාරණා දෙකට අදාළව විධිමත් දත්ත ගබඩාවක් පවත්වාගෙන යා යුතු බවට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ මුල්‍ය/ ඉංජිනේරු) |
| 18. | මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය සම්බන්ධව | මානව සම්පත් කලමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා මේ වන විට තොරතුරු ඇතුලත් කර ඇති බවත් ඒ සඳහා අංශ ප්‍රධානීන් වෙත තොරතුරු අධීක්ෂණය කිරීමේ හැකියාවක් පවතින අතර තම පරිගණකය වෙත එම පද්ධතිය ඇතුලත් කර ගැනීමට කටයුතු කරන ලෙසත් නිලධාරීන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහා එය අධීක්ෂණය කරන ලෙස හා එය යාවත්කාලීන කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 19. | තැපැල සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලයේ එක් එක් අංශ සඳහා ලැබෙන ලිපි සම්බන්ධව කටයුතු කිරීමට ඒ ඒ අංශ මඟින් තමාට ආවේනිකව දත්ත පද්ධතීන් සකස් කරගෙන ඇත. ලැබෙන ලිපි සම්බන්ධව අංශ වශයෙන් වෙන් වෙන්ව දත්ත පද්ධතීන් පවත්වාගෙන යනු වෙනුවට ප්‍රධාන ලේකම් කාර්යාලය වශයෙන් ඕනෑම අංශයක නිලධාරියෙකු හට ලිපි සම්බන්ධව තොරතුරු ලබා ගැනිමට හැකිවන පරිදි එකම දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ වැදගත්කම පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) විසින් කරුණු දක්වන ලදී.<br>ප්‍රධාන ලේකම් කාර්යාලයට අමතරව එම දත්ත පද්ධතිය සඳහා අමාත්‍යාංශ මට්ටමින්ද ලිපි සම්බන්ධ තොරතුරු අධ්‍යනය කිරීමට කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳ මේ සමඟ පෙන්වා දෙන ලදී.<br>ඒ අනුව මෙය ඉතාමත් වැදගත් කාරණයක් වන බවට සාකච්ඡා කළ අතර මෙය සකස් කිරීමේ හා පවත්වාගෙන යාමෙ කටයුතු තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මඟින් සිදුවිය යුතු අතර මේ වන විට ඔවුන්ගේ ගිවිසුමට ඒ සම්බන්ධ කරුණු ඇතුලත්ව නොමැති බැවින් 2024 වර්ෂයේ දී ලැබෙන ලිපි සඳහා තොරතුරු පද්ධතියක් සකස් කිරිම සම්බන්ධව ගිවිසුමට ඇතුලත් කිරිම සඳහා තීරණය කරන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 20 | රාජකාරී ලිපිවල නිලධාරීන්ගේ සන්නිවේදන තොරතුරු ඇතුලත් කිරිම සම්බන්ධව | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 2/2022 ට අනුව ඕනෑම රාජකාරී ලිපියක මාණ්ඩලික නිලධාරියා අත්සන් කිරීමෙන් පසු එම කරුණ සඳහා වගකියනු ලබන නිලධාරියාගේ දුරකතන අංකය ,ෆැක්ස් අංකය හා විද්‍යුත් ලිපිනය සඳහන් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව ප්‍රධාන ලේකම් කාර්යාලයේ සියළුම රාජකාරී ලිපි සඳහා එම චක්‍රලේඛයට අනුගතව ක්‍රියා කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත